# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1707/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 13/11/2024 පැය 1330

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.11.12 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 85 | 150 | තඹ දඟර 01<br>යකඩ බැරල් 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.11.12 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තලංගම පොලිස් වසමේ බත්තරමුල්ල හන්දිය ආසන්න ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 120 ක් හා යතුරුපැදියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කුරුණෑගල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන තලවතුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.11.12 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් විසින් වරාය පොලිස් වසමේ වරාය නගරය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද විදේශීය දුම්වැටි 2,200 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වරාය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වූ තඹුත්තේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** වරාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් හතර දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.11.12 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අක්මීමන පොලිස් වසමේ පින්නදූව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 205 මිලි ග්‍රෑම් 740 ක්, මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන මුදල් රුපියල් 20,640 ක් හා කාර් රථයක් සමඟ සැකකරුවන් 04 දෙනෙකු** අත්අඩංගුවට ගෙන අක්මීමන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31 ත් 38ත් අතර වයස් වල පසුවන කොළඹ, මඩපාත, කැළණිය හා කොටහේන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ .** අක්මීමන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. හෙරොයින් හා කොකේන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පරාම උප කඳවුර.**

2024.11.12 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පරාම උප කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මිදිගම පොලිස් වසමේ වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 250 ක්, කොකේන් ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 150 ක් සන්තකයේ තබා ගනිමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මිදිගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන අහංගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** මිදිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුර.**

2024.11.12 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සියඹලාණ්ඩුව පොලිස් වසමේ 06 වන ගම්මානය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 18 මිලි ග්‍රෑම් 100 ක් සමඟ මත්කරල් 38 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන සියඹලාණ්ඩුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** සියඹලාණ්ඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුර.**

2024.11.12 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පොතුවිල් පොලිස් වසමේ හැඩඔය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 41 **ක් වූ හුලංනුගේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. බලපත්‍ර නොමැතිව සිප්පි කටු කුඩු ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ලාහුගල කඳවුර.**

2024.11.12 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් චීන වරාය පොලිස් වසමේ කප්පල්තුරෙයි ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව සිප්පි කටු කුඩු ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු ලොරි රථයත් සමඟ** චීන වරාය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වූ පුලියන්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** චීන වරාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**